www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද නිවාස අලෙවිය වාර්තාගත ලෙස පහත වැටේ

## Record drop in US home sales

**බැරී ග්‍රේ විසිනි**

**2010 අගෝස්තු 25**

නැෂනල් ඇසෝසියේෂන් ඔෆ් රියල්ටර්ස් විසින් 24 දින නිකුත්කල වාර්තාවකට අනුව එක්සත් ජනපදයේ නිවාස අලෙවිය ජූනි මාසයට සාපේක්ෂව ජූලි මාසයේදී සියයට 27.2 න් වාර්තාගත ලෙස කඩාවැටුනි.

නිවාස අලෙවිය මුලුමනින්ම පාහේ බිඳවැටීම රටේ සෑම ප්‍රදේශයකටම බලපා තිබේ, එය ආර්ථික විචාරකයන් අපේක්ෂාකලාට වඩා දෙගුනයකටත් වඩා වැඩි මට්ටමකි. ඔවුන් අනාවැකි පලකොට තිබුනේ පහත වැටීම සියයට 12.1 ක වන බවට ය. ජූනි මාසයෙහි අලෙවියේ පහතට නැඹුරු සංශෝධිත සංඛ්‍යාව වන ඒකක මිලියන 5.26 සමග සසඳන කල ජූලි මාසයේ අලෙවිය ඒකක මිලියන 3.83 න් පහත වැටුනි.

වාර්ෂික පදනමකින් සලකන කල 2009 ජූලි මාසයේ ඒකක මිලියන 5.14 වූ අනුපාතය මේ වසරේ එම මාසයේදී සියයට 25.5 න් පහත ගියේය.

වාර්තා තැබීම ආරම්භ කල 1968 වසරේ සිට සටහන්වූ විශාලම මාසික වැටීම මෙම ජූලියේදී සිදුවිය. එක්සත් ජනපදයේ වාර්ෂික පදනමක නිවාස අලෙවි අනුපාතය 1995 වසරෙන් පසු වාර්තාවූ පහලම මට්ටම එය විය.

නිවාස අලෙවිය ඊසානදිග ප්‍රදේශයේ සියයට 29.5 ද දකුනේ සියයට 22.6 ද බටහිර සියයට 25 ද මිඩ්වෙස්ට්හි සියයට 35 ද වැටුනි. නිවාස ක්ෂේත්‍රයේ කඩා වැටීම හා දිගු කාලීන මහජන විරැකියාව මගින් ජනනය කල සමාජ අතෘප්තිය අතර සම්බන්ධය සංඛ්‍යා දෙකකින් පෙන්නුම් කෙරේ. අලෙවිකල නිවාසවලින් තුනෙන් එකක්ම පාහේ ආතති සහගත දේපල ය. සුවිශේෂිත වේගයකින් අලෙවිය වැටී ගියේ පහලම හා මධ්‍යම මට්ටමේ මිල නියම කර තිබුනු නිවාස ය. මිඩ්වෙස්ට්හි අලෙවිය සඳහා ඉදිරිපත්කොට තිබුනු ඩොලර් ලක්ෂය හා දෙලක්ෂ පනස්දහස අතර මිල ගනන්වල නිවාස අලෙවිය සියයට 47 කට ආසන්නව පහත වැටුනි.

නිවාස ගැනුම්කරුවන්ට මධ්‍යම ආන්ඩුවෙන් ලබාදී තිබුනු බදු සහනය අහෝසි වීමෙන් පසුව මිලට ගැනුම් එක දිගට තෙවෙනි මාසයටත් පහත වැටුනි. නිවාස වෙලඳපොල කෙරෙහි බදු සහනය අහෝසි කිරීමේ බලපෑම, නිවාස වෙන්දේසියේ දැමීම ඉහල යාමත් උකස් නය ගෙවීම පැහැර හැරීමේ අනුපාතය වැඩිවීමත් මගින් උත්සන්න වී තිබේ.

නිවාස වෙලඳපොල බිඳ වැටුනු 2007 වසරේ පැවතියාට වඩා නිවාස වෙන්දේසි කිරීම් දහ ගුනයකින් තරම් ඉහල ගොස් තිබේ. පසුගිය සතියේ ඩොයිෂෙ බැංකුව විසින් නිකුත්කල සමීක්ෂනයකට අනුව එක්සත් ජනපද කොන්ග්‍රස් සභා දිස්ත්‍රික්කයක (දින 90 කට වඩා උකස් නය ගෙවීම පැහැර හැරි) බරපතල පැහැරහැරීම් අනුපාතයේ සාමාන්‍යය 2008 මැතිවරන සමයේ පැවතියාට වඩා තුන් ගුනයකින් තරම් වැඩිවී ඇත.

රියල්ටර්ස් වාර්තාව ද ජූලි මාසයේ නොවිකිනී ඉතිරිවූ නිවාස තොගය තියුනු ලෙස වැඩිවීමක් සටහන් කලාය. මාසය අවසානයේදී අලෙවිය සඳහා තිබූ නිවාස සංඛ්‍යාව මිලියන 3.98 කි. එය ජූනි මාසයේ 8.9ක මාසික සැපයුම 12.5ක මාසික සැපයුමක් කරා පිරිහී යාමකි. එය දශකයකට පසු වාර්තාවූ ඉහලම මට්ටමයි. තිබෙන නිවාසවල හය මාසයක් සඳහාවූ සැපයුම ඉහලම මට්ටම ලෙස සලකනු ලබයි.

නිවාස අලෙවියේ ව්‍යසනය පිලිබඳ වාර්තාව, පසුගිය සතියේ පලවූ අලුත් නිවාස ඉදිකිරීම්, නව නිවාස බලපත්‍ර හා අනෙකුත් අඳුරු සංඛ්‍යා පිලිබඳ වාර්තා සමග එක්ව යයි. ඒවාට, ආර්ථික වර්ධනයේ තියුනු හැකිලීමක් ඇඟවුම් කරමින් දැනටමත් අවපාතයේ මට්ටම් කරා ලඟාවෙමින් තිබෙන විරැකියාවේ තවදුර වර්ධනය සලකුනු කරන ආරම්භක විරැකියා සහන ඉල්ලීම් නව මාසයක ඉහලම මට්ටමට ලඟාවීම ද ඇතුලත්ය.

සිකුරාදා දිනයේදී වෙලඳ දෙපාර්තමේන්තුව, එක්සත් ජනපදයේ දෙවැනි කාර්තුවෙහි ආර්ථික වර්ධනය පිලිබඳ සිය සංශෝධිත ඇස්තමේන්තු නිකුත් කිරීමේදී පසුගිය මාසයේ වාර්තාකල සියයට 2.4 ක වර්ධන අනුපාතිකය සියයට 1.3 දක්වා පහත හෙලනු ඇතැයි බොහෝ අර්ථශාස්ත්‍රඥයෝ විශ්වාස කරති. මෙම අඳුරු අනාවැකිය පවා පමන ඉක්මවා ශුභවාදී වනු ඇත. පසුගිය සති ගනනාවකම නිකුත්වූ සෑම ආර්ථික දර්ශකයක්ම පාහේ අර්ථශාස්ත්‍රඥයින්ගේ අනාවැකි වලට වඩා නරක විය.

මිලන් ටබැක් සහ සමාගමේ ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ ඩෑන් ග්‍රීන්හොවුස් 24 දින සිය සමීක්ෂන වාර්තාවක සඳහන් කලේ "නිවාස ක්ෂේත්‍රය මුලුමනින්ම නැත්නම් බිඳවැටීමේ අද්දරට පැමින තිබේ." යනුවෙනි.

කැපිටල් ඉකොනොමික්ස්හි පෝල් ඩේල් කියා සිටියේ "දැනටමත් කොරගසමින් තිබෙන පුලුල් ආර්ථික ප්‍රකෘතියට නිවාස වෙලඳපොල විසින් වලකපනු ඇතැයි යන්න සක් සුදක් සේ පැහැදිලි වීමට පටන් ගෙන තිබේ. එන්ට එන්ටම නොවැලැක්විය හැකි නිවාස මිල ගනන් වලට දෙපසකින් පහර වැදීම පටන් ගන්නවාත් සමඟම තත්වය බෙහෙවින් නරක අතට හැරීමට ඉඩ ඇත."

නිවාස සංඛ්‍යා විශ්ලේෂනය කල සටහනක් තුල එච්අයිඑස් ග්ලෝබල් ඉන්සයිට්හි ප්‍රධාන එක්සත් ජනපද අර්ථශාස්ත්‍රඥ නීගල් ගවුල්ට් මෙසේ ලිවීය. නිවාස වෙලඳපොලෙහි "සපල ඉහල නැගීමක් පදනම්වනු ඇත්තේ මේ දැන් පනගැන්වෙනවා වෙනුවට මන්දගාමී වෙමින් පවතින රැකියා වෙලඳපොලෙහි ප්‍රගතිය මතය. පොලී අනුපාතික පහතම මට්ටමේ පැවතිය ද එහි සිදුවෙමින් ඇති ප්‍රකෘතියක් පිලිබඳ කිසිදු සලකුනක් දක්නට නැත."

තිස් අවුරුදු ස්ථාවර උකස්කරයන්හි සාමාන්‍ය අනුපාතිකය දශක ගනනාවකට පසු එහි පහතම අනුපාතිකය කරා ලුහුටා ගියේ සියයට 4.42 වැටීමක් සලකුනු කරමිනි. එතරම් සිත්ගන්නා සුලු අනුපාත තිබියදී පවා නිවාස අලෙවිය දිගටම හැකිලී යාමෙන් පෙන්නුම් කරන්නේ ආර්ථික අර්බුදයේ ගැඹුර හා කිසිදු ප්‍රකෘතියක සලකුනක් නොමැති වීමය. නොඑසේ නම් වෙලඳපොලෙහි පෙනී සිටිනු ඇති කම්කරුවන්, කිසිවක් මිලට නොගන්නේ ඔවුන්ගේ රැකියා නැතිවී ඇති නිසා හෝ විරැකියා පෝලිමට එකතු වීමට සිදුවේය යන බිය නිසාය. බැංකු ද තම කොන්දේසි දැඩි කර ඇති අතර නයදීම් කපාහැර තිබේ.

එක්සත් ජනපද ආර්ථිකය මන්දගාමී වීම පිලිබඳ අලුත්ම සලකුනු හමුවේ ලෝකය පුරාම කොටස් වෙලඳපොලවල් තියුනු ලෙස පහත වැටුනි. එක්සත් ජනපද නිවාස වාර්තාව අපේක්ෂාවෙන් සිටීමේ කොටසක් ලෙස 24 දින උදෑසන පහතට පිනූ ආසියානු කොටස්, පසු දිනයේ ද එලෙසම පැවතුනි. එක්සත් ජනපදයේදී සිදුවූවාක් මෙන්ම යුරෝපීය කොටස් ද 25 දින සියයට එකකට වඩා පහල ගියේය. ඩව් ජෝන්ස් දර්ශකය ඒකක 133 න් පහත වැටුනේ සියයට 1.3 ක පසුබෑමක් සටහන් කරමිනි. එස්ඇන්ඩ්පී 500 හා නැස්ඩැක් කාර්මික දර්ශක ප්‍රතිශත පදනමකින් ඊටත් වඩා පහත වැටුනි, එය වෝල් වීදියේ එක දිගට සිදුවූ හතරවන වැටීමයි.

අනෙකුත් ගෝලීය දර්ශකයන් පෙන්නුම් කලේ දෙපැත්තකින් පහර දෙන පසුබෑම පිලිබඳ නැගී එන භීතිය හා විශ්වාසනීයත්වයේ බාදනයකි. සති 11 පසු බොරතෙල් මිල එහි පහලම අගය කරා ලඟා වූයේ බැරලය ඇමරිකානු ඩොලර් 72 සීමාවෙන් පහත යමිනි. නිව් යෝර්ක් වානිජ්‍ය හුවමාරුවේ කොමෙක්ස් අංශයේ රත්රන් අවුන්සයක් ඩොලර් 4.9 න් ඉහල යමින් 1233.40ට නියම විය. දස අවුරුදු එක්සත් ජනපද භාන්ඩාගාර බැඳුම්කරයන්ගේ ලාභානුපාතිකය සියයට 2.499 දක්වා පහත වැටුනේ විශාල ආයෝජකයන් "රැකවරනය සොයා පියඹා යාම" පිලිබිඹු කරමිනි.

ඔබාමා පාලනාධිකාරය වේවා රිපබ්ලිකානු විරුද්ධවාදීන් වේවා එක්කෝ විරැකියාවෙන් නැත්නම් අර්ධ කාලීන විරැකියාවෙන් පෙලෙන මිලියන 20කට වැඩි කම්කරුවන් සඳහා රැකියා සැපයීමට හෝ සහන සැලසීමට කිසිදු බැරෑරුම් යෝජනාවක් ගෙන ඒමට අසමත්ව සිටියි. ඩිමොක්‍රටිකයන් හා රිපබ්ලිකානුවන් බෙදී සිටින්නේ ධනේශ්වර අර්බුදයේ මුලු බර කම්කරු පන්තිය මත පැටවීමේ වඩාත්ම සඵල උපායන් කවරේද යන්න මත පමනි.

අගෝස්තු 24 දා නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ රිපබ්ලිකානු නායකයා වන ජෝන් බුහ්නර්, රැකියා විරහිතයින් හා ආර්ථික වශයෙන් පීඩාවට පත් වැඩකරන ජනතාවගේ උපදේශකයෙක් ලෙස පෙනී සිටීමට උත්සාහ කරමින් වාචාල කතාවක් පැවැත්වීය. රැකියා අර්බුදය විසඳීමට අසමත්වීම සම්බන්ධව ඔබාමා හෙලාදුටු ඔහු, ඔබාමාගේ ඉහල ආර්ථික උපදේශකයන්ට ඉල්ලා අස්වන ලෙස බල කලේය. ඒ භාන්ඩාගාර ලේකම් තිමොති ගේත්නර් හා ධවල මන්දිරයේ ජාතික ආර්ථික කවුන්සිලයේ අධ්‍යක්ෂ ලෝරන්ස් සමර්ස් වැනි අයටයි.

කෙසේ වුව ද ඔහුගේ එකම නිශ්චිත යෝජනාව වූයේ වසරකට ඩොලර් දෙලක්ෂ පනස්දහසකට වැඩි ආදායම් උපයන මුලු කුටුම්භයන්ගෙන් සියයට දෙකක් වන ධනවතුන් සඳහා බුෂ්ගේ බදු කපාහැරීම පුලුල් කලයුතුය යන්නයි. ඔහු, මධ්‍යම රජය හදිසි විරැකියා සහන දීර්ග කිරීම හා කොංග්‍රසය විසින් සම්මත කල, ප්‍රාන්ත රාජ්‍ය සඳහා ඩොලර් බිලියන 26 ක මධ්‍යම රජයේ ආධාරය ද විවේචනය කලේය.

ඊට ප්‍රතිචාර ලෙස ඩිමොක්‍රටිකයෝ කට දෙකොනින්ම කථා කරමින්, ඔබාමාගේ ආර්ථික ප්‍රතිපත්තිය ලබා ඇතැයි කියාපාන "සාර්ථකත්වය" හුවා දක්වන අතරේ, මහජන විරැකියාව හා වැඩෙන දුප්පත්කම පිලිබඳව බුෂ් පරිපාලනයට දොස් පැවරීමේ වංචනික උපාමාරුවක නිරතවූහ. උප ජනාධිපති ජෝසෆ් බිඩෙන් කියා සිටියේ ඔබාමාගේ 2009 උත්තේජක පැකේජය, "අට වසරක අසාර්ථක ආර්ථික පිලිවෙතෙන් ආර්ථිකය ගලවාගෙන එය පෙර කවරදාකටත් වඩා ශක්තිමත් ලෙස ගොඩනැගීම සඳහා වැඩට බැස ඇත" යනුවෙනි.

ඔබාමා විවේකය ගතකරමින් සිටින මැසසුෂෙට්ස්හි මාතාගේ වයින් උයන නම් සුවිශේෂී නිවාඩු දිවයිනෙහි සිට කථාකරමින් ධවල මන්දිරයේ නියෝජ්‍ය මාධ්‍ය ලේකම් බිල් බර්ටන් ප්‍රකාශ කලේ බොයිනර්, "අපගේ ආර්ථිකය නිවැරදි දිශාවට යොමුකිරීමේ වෙහෙසකර වැඩකටයුතු සඳහා උපකාර කල හා "දරදඬු තීන්දු" ගැනීම සඳහා සහාය දුන් එම මිනිසුන්ටම පහරගසා ඇති" බවයි.

එම "දරදඬු තීන්දුවලට," ඩොලර් ට්‍රිලියන ගනනක බැංකු ඇපදීම්, ජෙනරල් මෝටර්ස් හා ක්‍රයිස්ලර් සමාගම් බලහත්කාරයෙන් බංකොලොත් කරවීම, ලක්ෂ ගනනක් රථවාහන කම්කරු රැකියා විනාශ කිරීම, අලුතින් බඳවාගන්නා රථවාහන කම්කරුවන්ගේ වැටුප් හරි අඩකින් කපාහැරීම මෙන්ම වෙනත් කිසිදු උත්තේජක පියවර ගැනීමක් ප්‍රතික්ෂේප කිරීම හා ඒ වෙනුවට සමාජ වැඩසටහන්වල ගැඹුරු කප්පාදු වෙත යොමුවීම ද ඇතුලත්ය.

බිඩෙන්, ඔබාමාගේ රථවාහන ප්‍රතිපත්තිය ජයග්‍රාහී "නවීකරනය" පිලිබඳ නිදසුනක් ලෙස හුවා දැක්වීය. මෙම ප්‍රතිපත්තියේ සාරය වනාහි, විරැකියාව වේදනාකාරී ලෙස ඉහල මට්ටමක තබාගනිමින් එය ඇමරිකානු කම්කරු පන්තියේ වැටුප් හා ජීවන තත්වයන් අඛන්ඩව පහත හෙලීම සඳහා කසයක් ලෙස යොදාගැනීම, එක්සත් ජනපදයේ කම්කරුවන් හා චීනය, ඉන්දියාව හා අනෙකුත් "නැගීඑන ආර්ථිකයන්" හි රුදුරු ලෙස සූරාකන කම්කරුවන් අතර වෙනස අකාමකා දැමීමයි. මේ පදනම මත ඔබාමා පරිපාලනය, ගෝලීය වෙලඳපොලවලට කෙරෙන අපනයන සඳහා ලාභ ශ්‍රම වේදිකාවක් ලෙස එක්සත් ජනපද කර්මාන්තය පිලිසකර කිරීමට උත්සාහ දරනු ලැබේ.

© www.wsws.org